**දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2017**

-----------------------------------------------------------------------------------

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 ජූලි 10 දින එළඹි අංක 5417 - එල් කේ දරන මූල්‍ය ගිවිසුමේ 1 ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය සහ ප්‍රදාන සඳහා සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, එවකට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, වර්තමානයේ වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. දේශගුණික අවදානම් ඇති විය හැකි ජනතාව හා වත්කම් අනතුරු වලට භාජනය වීම අඩුකිරීම සහ ආපදා වලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,617 කට සමාන එජඩො මිලියන 111.8 ක් වන අතර ඉන් රු.මිලියන 14,382 කට සමාන එජඩො මිලියන 110 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 05 දින ආරම්භ කරන ලද අතර 2019 මැයි 30 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා

විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ හා එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජා සං සං | 110.0 | 14,382 | 3,250 | 16.76 | 2,558.06 | 49.52 | 7,190.39 |
| ශ්‍රී ලං ර | 1.8 | 235 | 50 | 0.33 | 50.20 | 0.74 | 107.19 |
| එකතුව | 111.8 | 14,617 | 3,300 | 17.09 | 2,608.26 | 50.26 | 7,297.58 |

2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් වර්ෂ 03 ක් ඉකුත් වීමෙන් පසුවත් මූල්‍ය ගිවිසුමේ කරන ලද රු.මිලියන 14,382 කට සමාන එජඩො මිලියන 110 ක වෙන්කිරීමෙන් රු.මිලියන 7,190.39 කට සමාන එජඩො මිලියන 49.52 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග නොගතහොත් ඉතිරි වර්ෂ 1 ½ ක කාල පරිච්ඡේදය තුළදී රු.මිලියන 7,191.61 කට සමාන එජඩො මිලියන 60.48 ක ඉතිරි ශේෂය උපයෝජනය කිරීමේ හැකියාව ඉතා අඩුවිය හැක.

## 3.2 භෞතික ප්‍රගතිය

--------------------

ව්‍යාපෘතියේ කාර්යය ප්‍රධාන වශයෙන් දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ආර්ථිකයක් ස්ථාපිත කිරීම කේන්ද්‍ර කර තිබූ අතර ව්‍යාපෘතිය ද්‍රෝණි ආයෝජන සැලසුම් සංවර්ධනය, දේශගුණික අව බලපෑම් අවම කිරීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහාය ලබාදීම හා හදිසි අසම්භාව්‍යයන්ට ප්‍රතිචාර දැක්වීම යන ප්‍රධාන සංරචක 4 කින් සමන්විත විය. කෙසේ වුවද, පහත විස්තර කර ඇති පරිදි විශේෂඥවරුන්ගේ දැනුම පිළිබඳ හිඟකම, අයහපත් කාලගුණ තත්ත්වය සහ විශ්ලේෂණාත්මක හා අනාවැකි සැපයීමේ කාර්යයන් සඳහා අවශ්‍ය තොරතුරු නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතියේ එක් එක් සංරචකයන් යටතේ ක්‍රියාත්මක කරන ලද කාර්යයන් 2017 දෙසැම්බර් 31 දිනට අඩු ප්‍රගතියක් දක්වා තිබුණි.

(අ) ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂක හා නැවත පදිංචි කිරීමේ විශේෂඥ, සන්නිවේදන විශේෂඥ, පරිසර ආරක්ෂක විශේෂඥ, මානව සම්පත් නිලධාරීන් යන ප්‍රධාන තනතුරු සඳහා සුදුසු විශේෂඥයින් හා සහාය කාර්ය මණ්ඩලයේ වෙනත් තනතුරු කිහිපයක පැවති ඌනතාවය සහිතව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ උපදේශක සේවාවල යෙදී සිටින ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයද උපදේශක කාර්ය මණ්ඩලයේ ඌනතාවයන් සහිතව ක්‍රියාත්මක වෙමින් පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, නායයෑම් අවදානමට ලක් වී සිටින මහනුවර දිස්ත්‍රික්කයේ පාසැල් 18 කින් පාසැල් 06 ක බෑවුම් ස්ථායිකරණ වැඩ 2017 වර්ෂය අවසානයේදී සම්පූර්ණ කර නොතිබුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරුන් බඳවා ගැනීමට කටයුතු කර තිබුණද, බෑවුම් ස්ථායිකරණ වැඩ පිළිබඳ උපදේශකවරුන්ගේ මෙන්ම කොන්ත්‍රාත්කරුවන්ගේ ද පළපුරුද්ද නොමැති වීම හේතුවෙන් එය අපේක්ෂිත පරිදි සාර්ථක වී නොතිබුණි.

(ඇ) ද්‍රෝණි ආයෝජන සැලැස්ම (Basin Investment Plan) සංරචකය යටතේ ගංගා ද්‍රෝණි 10 ක් සංවර්ධනය කිරීම සඳහා උපදේශක කොන්ත්‍රාත්තු පිරිනැමීමට සැලසුම් කර තිබුණි. කැළණි ගඟ, අත්තනගලු ඔය, මල්වතු ඔය හා දැදුරු ඔය ගංගා ද්‍රෝණි සංවර්ධනය වෙනුවෙන් උපදේශකවරුන් සඳහා කොන්ත්‍රාත්තු පිරිනැමීමට වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ පියවර ගෙන තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීමට අනුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා අනෙකුත් නියෝජිතායතන විසින් වර්ෂ 40 ක වර්ෂාපතන දත්ත හා අනෙකුත් තොරතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ඒ සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා ප්‍රමාද වී පිළියෙල කර තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් පැකේජ 12 ක් යටතේ ජාතික මාර්ගවල පාලම් පුනරුත්ථාපනය කිරීමෙහි හා නායයාම් අවදානම්වලින් ආරක්ෂා වීමට හා අඛණ්ඩ ප්‍රවාහනය තහවුරු කිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත් පැකේජ 08 ක් යටතේ මාර්ග දෙපස බෑවුම් ස්ථායීකරණයෙහි මාර්ග සංවර්ධන අධිකාරිය යෙදී තිබුණි. කොඩ්ඩමුනෙයි, මඩකලපුව-ත්‍රිකොන්ඩයිමඩු, ත්‍රිකුණාමලය මාර්ගය හා පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි මාර්ගයේ පාලම්වල පුනරුත්ථාපන වැඩ පිළිබඳ භෞතික ප්‍රගතිය ඉලක්කයන්ට වඩා පසුපසින් පැවතුණි. එසේම මාර්ග දෙපස බෑවුම් ස්ථායීකරණය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ මෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ විශේෂඥ දැනුම පිළිබඳ හිඟකම හේතුවෙන් මහනුවර-මහියංගනය මාර්ගයේ මාර්ග දෙපස බෑවුම් ස්ථායීකරණය යටතේ වැඩ මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

2018 පෙබරවාරි මාසයේදී විගණකවරුන් විසින් නියැදි පරීක්ෂණ මත පදනම්ව ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරන ලද අතර මහනුවර දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් වැඩ පිළිබඳව පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) මහනුවර ධර්මරාජ විද්‍යාලයේ අස්ථාවර බෑවුම ශක්තිමත් කිරීම සඳහා රු.මිලියන 95.10 ක ඇස්තමේන්තුගත පිරිවැයකට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. ගොඩනැගිල්ලේ හා විද්‍යාලයේ විදුහල්පති කාර්යාලයට පිටුපසින් ඇති ගලක් වැටීමේ අවදානම වළක්වා ගැනීම සඳහා වැඩි පීඩක කොන්ක්‍රීට් තට්ටුවක් සමඟ අවුරන ලද ඇණ (insulate nails) සහ කම්බි දැල යෙදීමට පියවර ගෙන තිබුණි. කෙසේ වුවද, කොන්ක්‍රීට් ආස්තරණය කරන ලද පෙදෙස තුළ "මානා" පඳුරු වැවී තිබූ අතර ඒ අනුව කොන්ක්‍රීට් ආස්තරණ වැඩ අවශ්‍ය ගුණාත්මක ප්‍රමිතියට අනුකූල නොවූ බව නිරීක්ෂණය විය.

(ආ) මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පිහිනුම් තටාක පෙදෙසේ අස්ථායී බෑවුමේ නායයෑම වළක්වා ගැනීම සඳහා ආරක්ෂිත පැල වගාවක් ලෙස ලණු මළුවල හා කම්බි දැලෙහි "උඳුපියලිය" ශාකය වැවීමට රු.මිලියන 1.50 ක මුදලක් වැය කර තිබුණි. තවද, මහාමායා බාලිකා විද්‍යාලයේ පිටුපස අස්ථායී බෑවුමේ ලණු මළුවල හා කම්බි දැලෙහි "උඳුපියලිය" ශාකය වැවීම සඳහා රු.මිලියන 2.22 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වුවද, "උඳුපියලිය" ශාකය උඩින් මානා පඳුරු වැවී තිබුණු බව නිරීක්ෂණය වූ අතර, ආරක්ෂිත ශාකයක් ලෙස උඳුපියලිය ශාකය වැවීමේ ඵලදායීතාවය ප්‍රශ්නගතව පැවතුණි.

(ඇ) ස්වභාවික විපත්වලට ඉඩ හරිමින් හා අදාළ පාසැල්වල සිසුන්ගේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා දුෂ්කරතාවලට මුහුණ දෙමින් මහනුවර දිස්ත්‍රික්කයේ රජයේ පාසැල්වල නායයෑම් අවදානම අවම කර ගැනීම සඳහා වූ ඉදිකිරීම් වැඩ කිහිපයක් අතරමඟ අත්හිටුවා තිබුණු බව නිරීක්ෂණය විය.

නිරීක්ෂණය වූ එවැනි අවස්ථා පහත විස්තර කෙරේ.

(i) කොන්ත්‍රාත්කරුවන්ගේ නොහැකියාව හේතුවෙන් හල්ලොලුව නවෝදය විදුහලේ මහල් 2 කින් යුත් ගොඩනැගිල්ල නායයෑම් අවදානමෙන් වළක්වා ගැනීම සඳහා ආරක්ෂිත බැම්මක් ඉදිකිරීමේ වැඩ හා පිවිසුම් මාර්ගයේ වැඩ 2018 පෙබරවාරි 20 දිනට අතරමඟ අත්හිටුවා තිබුණි. එබැවින්, අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රතිලාභීන්ට කාලානුරූපව ලැබී නොතිබුණි.

(ii) ප්‍රධාන මාර්ගයේ පැත්තක ඉදිකර තිබූ ආරක්ෂිත බැම්මට හානි සිදුවිය හැකි අයුරින් මහනුවර ආනන්ද විද්‍යාලයේ වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීමේ වැඩ 2018 පෙබරවාරි 20 දිනට අතරමඟ අතහැර දමා තිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, රු.මිලියන 1,257.24 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 63 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිම කිරීම සඳහා අවශ්‍ය වී තිබුණි. කෙසේ වුවද, රු.මිලියන 317.63 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 32 ක් එම දිනට නිම කර නොතිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය හා ව්‍යාපෘති කළමනාකරණ ඒකක 06 ක් සඳහා තනතුරු 230 ක් වෙනුවෙන් නිලධාරීන් 1,117 ක අනුමත කාර්ය මණ්ඩලයකින් ව්‍යාපෘතිය සමන්විත වූ අතර තනතුරු 132 ක් සඳහා නිලධාරීන් 461 ක පුරප්පාඩු වර්ෂ 01 කට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව පාරිසරික ආරක්ෂණ විශේෂඥ, ව්‍යාපෘති ඉංජිනේරුවරුන් තිදෙනෙකු හා තාක්ෂණික නිලධාරියකු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යොදවා තිබුණි.

**3.5 ව්‍යාපෘතියේ මූල්‍ය පාලන සම්බන්ධයෙන් ගැටලු**

-----------------------------------------------

ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති පරිපාලන අත්පොතේ අවශ්‍ය පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු හා ගණකාධිකාරිවරයෙකුගෙන් සමන්විතව ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන කමිටුවක් විසින් අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වූ නමුත් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයකු සහ මාර්ග සංවර්ධන අධිකාරියේ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ හා වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරීන් තිදෙනෙකු පත්කර තිබුණි. තවද, ඉහත සඳහන් නිලධාරීන්ගෙන් බොහෝ දෙනෙක් ව්‍යාපෘති කාර්යයන් පිළිබඳ කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටි බැවින් ව්‍යාපෘති මෙහෙයුම් පිළිබඳ ස්වාධීන සමාලෝචන සිදුකිරීම කළ නොහැකි විය.

(ආ) මාස 09 ක කාල පරිච්ඡේදය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය වූ අතර, ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ ප්‍රමාණාත්මක සොයාගැනීම් සඳහා විස්තරාත්මක විමර්ශනයන් සිදුකර නොතිබූ බව අදාළ අභ්‍යන්තර විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණයන්ගෙන් නිරීක්ෂණය විය.

(ඇ) ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත අභ්‍යන්තර විගණන වාර්තා සෘජුවම ඉදිරිපත් කළ යුතු වුවද, එම අවශ්‍ය වාර්තා ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර තිබුණි.